**ශීර්ෂය - 327 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 19 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-----------------------------

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරිමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1994 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු තක්සේරු වටිනාකම රු.1,950,000 ක් වූ වෑන් රථයක් 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු වටිනාකම් ලබාගැනීමට ප්‍රමාද වීම හේතුවෙන් 2020 වර්ෂයේදී ගිණුම්ගත නොවූ අතර 2021 වර්ෂයේදී ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුවේ වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) අපහරණය කිරීමට තිබුණු තක්සේරු වටිනාකම රු.2,780,000 ක් වූ වාහන 04 ක් 2020 ජනවාරි 31 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත මුදා හැර තිබුණු නමුත් මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත්කර නොතිබුණි. | ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | අපහරණය කිරීමට මුදා හැර තිබුණු වාහනවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළ යුතුය. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණු රු.321,231 ක්වූ පරිගණක උපකරණවල වටිනාකමින් රු.108,000 ක් පමණක් මිලදී ගැනීම් ලෙස ගිණුම්වල දක්වා ඉතිරි රු.213,231 ක වටිනාකම සදොස් ලෙස ආරම්භක ශේෂයට එකතු කර දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මිලදී ගෙන තිබු පරිගණක උපාංගවල වටිනාකම වන රු.321,231න් රු.213,231ක මුදල ඉන්වෙන්ට්‍රි කිරීමේදී ඇතිවී තිබූ තාක්ෂණික දෝෂයක් මත රු. 28,367 ක් ලෙස ගිණුම්ගත වී ඇති අතර, එය නිවැරදි කිරීම සඳහා රු.28,367 ඉවත් කර නැවත අදාළ වර්ෂය තුලදීම රු.213,231 ක ආරම්භක ශේෂයක් ලෙස වත්කම් ගිණුමට නිවැරදිව ගෙන ඇත. | වර්ෂය තුළ මිලදී ගැනීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 7කට අදාළව එකතුව රු.2,529,015 ක සහ ප්‍රාග්ධන වැය විෂයයන් 5කට අදාළව එකතුව රු.3,540,009 ක ඉතිරිවීම් පැවතුණ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ත් 68 ත් අතර පරාසයක පැවතුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වැය විෂයයන් කීපයක ප්‍රතිපාදන ඉතිරි වීමක් දැකිය හැකි වේ. | ආයතනය වෙත ලබා දී ඇති ප්‍රතිපාදන සකසුරුවම්ව අදාළ කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් දෙකක් සඳහා එකතුව රු.1,800,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්වලින් මාරු කරගෙන තිබුණද ඉන් රු.1,045,337 ක් හෙවත් සියයට 58 ක්ම ඉතිරි කර තිබුණි. | මු.රෙ. 66 යටතේ මාරු කිරීම්වලින් ඉතිරිවීම් දැකිය හැකි වුවද 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මෙයට බලපාන ලදි. | වෙනත් වැය විෂයයන්වලින් මාරු කර ගනු ලබන ප්‍රතිපාදන අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පූර්ණයෙන් යෙදවිය යුතුය. |
| (ඇ) | එක් වැය විෂයයක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.2,650,000 කින් 2020 නොවැම්බර් 30 දිනට ඉතිරිය රු.418,720 ක් වී තිබුණි. එසේ තිබියදී හදිසි අවශ්‍යතා මත යයි කරුණු දක්වමින් වෙනත් වැය විෂයයකින් රු.1,500,000 ක් මාරු කර ගෙන තිබුණු නමුත්, ඉන් රු.336,663 ක් පමණක් වැය කර රු. 1,582,057 ක් ඉතිරි කර තිබුණි. | -එම- | -එම- |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

-----------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කලා ඔය ගංගා ද්‍රෝණි ඉඩම් පරිහරණ සැලසුම සහ මධ්‍යම කඳුකරයේ ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ 32 ක ඉඩම් පරිහරණ සැලසුම සකස් කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය මගින් රු.871,091 ක් ලබා දී තිබුණු අතර ඉතිරිව තිබූ රු.57,252 ක් නැවත පරිසර අමාත්‍යාංශය වෙත යවා තිබුණි. එසේ වුවද මෙම ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් කාර්යසාධන වාර්තාවේ සඳහන් කර නොතිබුණි. | අවසන් වාර්තාවේ එය ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනත් ආයතන මගින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ලබා දෙන ලද ප්‍රතිපාදනවල උපයෝජනය හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 වගන්තිය | මිල ගණන් කැඳවිය යුතු නමුත් එසේ නොකොට ප්‍රජා සංවර්ධන සමිතියකට සෘජුව පවරන ලද ප්‍රධාන කාර්යාලයට අයත් ගොඩනැගිලි නවීකරණ හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,446,380 ක් ගෙවා තිබුණි. | ප්‍රධාන කාර්යාලය මගින් දරා ඇති වියදම අවස්ථා කිහිපයකදී සිදුකර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 (35 වන සංශෝධනය) යටතේ මිලගණන් කැඳවීමකින් තොරව රු. 200,000 ක උපරිමයක් දක්වා සෘජු ප්‍රසම්පාදන මගින් සිදුකළ හැකි අතර දෙපාර්තමේන්තුව කිසිදු ගොඩනැගිලි අලුත්වැඩියාවක් සඳහා රු.200,000 ඉක්මවා නොමැති බව පෙන්වා දෙමි.\ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 2 (i) ඡේදය | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනයේ නමින් ලියාපදිංචි කර ගැනිමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වෙනත් ආයතන නමින් ලියාපදිංචි කර ඇති වාහන 09 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අතුරින් අංක 252-4978 දරන වාහනය ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය නමින්ද, අංක PE 1685 සහ අංක JV 1497 දරන වාහන ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය නමින්ද පවතී. අමාත්‍යාංශ බෙදීමේදී එම කොටස් වෙන් වී ඇති බැවින් එම වාහන අප දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කරන ලෙස අදාළ ආයතන ප්‍රධානින් වෙත නියමිත ආකෘතිපත්‍ර සමඟ ඉල්ලීම් කර ඇත. කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඇති ඉතිරි වාහන 06 ඉඩම් අමාත්‍යාංශ ලේකම් නමට ලබා දී ඇති අතර, කල්බදු අවසන්ව ලංකා බැංකුව විසින් මෙම වාහනවල අයිතිය ඉඩම් අමාත්‍යංශයේ ලේකම් වෙත ලබා දුන් පසු එම වාහන පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතනය පරිහරණය කරන නමුත් වෙනත් ආයතනවලට හිමිකම පවතින වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 03 ක් සඳහා ලබාදී තිබුණු රු.1,306,927 ක ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රගතිය සියයට 61 ත් 100 ත් අතර වී තිබුණු නමුත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 25 ත් 45 ත් අතර විය. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අදාළව විශේෂඥ කමිටු කැඳවීමට හා ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ ව්‍යාපෘතියේ භෞතික ඉලක්කය අනුව පුහුණු වැඩමුළු දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට නොහැකි විය. භූමි ශක්‍යතාවයට අනුව කෘෂිකාර්මික බිම් වර්ගීකරණය කිරීමේ නියමු ව්‍යාපෘතියක් ඉවත් කරන ලදි. අංක 2107/27 සහ 2020 අගෝස්තු 09 දිනැති | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අති විශේෂ ගැසට් පත්‍රය පරිදි අමාත්‍යාංශ විෂය පථය ගැසට් කිරීමේදී මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රමුඛ කාර්යයන් පැවරුනද ඒ සඳහා අමතර ප්‍රතිපාදනයක් වෙන් නොවූ බැවින් වාර්ෂික අපේක්ෂිත ඉලක්කය කරා ළඟා වීමටද, කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් කිරීමටද නොහැකි විය. | |
| (ආ) | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද එය සංශෝධනය කර අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය ප්‍රමුඛ කටයුත්තක් සේ සලකා දෙපාර්තමේන්තුව මගින් කටයුතු කරන ලදි. 2020 වර්ෂයේදී වැඩිදියුණු කරන ලද කෙටුම්පත විශේෂඥ කමිටුවක් මගින් තවදුරටත් සංවර්ධනය කර අවසන් කෙටුම්පත සකසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකිරීමට ඉලක්ක කළද 2020 වර්ෂය තුළදී අපේක්ෂිත ඉලක්කය ලඟා කරගත නොහැකි වූ අතර, එය 2021 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂා කෙරේ . | ආයතනයේ මූලික කාර්යයන්වලින් අපේක්ෂිත ඉලක්කයන් ලඟා කරගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව තිබූ තක්සේරු වටිනාකම රු.6,280,000 ක් වූ අපහරණය කිරීමට නියමිත වාහන 7 ක් සමාලෝචිත වර්ෂය වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබූ නමුත් 2021 අප්‍රේල් මස අවසානය වන විටත් එම වාහනවල හිමිකම පවරාදී නොතිබුණි. මේ අතුරින් වාහන 2 ක් ඉඩම් අමාත්‍යාංශයේ නමටත්, 01 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියේ (UNDP) නමටත් ලියාපදිංචි කර තිබෙන බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ. | මෙම වාහන අතරින් දෙපාර්තමේන්තුව නමට ඇති වාහන 04 න් 03 ක් මේ වන විටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට අවශ්‍ය ලේඛන හා ආකෘති පත්‍ර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. දෙපාර්තමේන්තුව නමට ඇති 61 – 3543 දරන වාහනයේ අයිතිය පැවරීමට යාමේදී එහි ආදායම් බලපත්‍ර පිළිබඳ පැන නැගී ඇති ගැටළුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී නිරාකරණය කර ගත් වහාම එහි අයිතියද වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට | අපහරණය කිරීමට භාර දී තිබූ වාහනවල හිමිකම පවරාදී එම කටයුතු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු කරමි. ඉතිරි වාහන 03න් ඉඩම් අමාත්‍යාංශයේ නමටත්, UNDP ආයතනයේ නමටත් ඇති වාහන දෙක පවරා දීමට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ වාහන පවරා ගැනීමට කටයුතු කරන ලෙස ලිඛිතව දන්වා ඇති අතර මෙම දෙපාර්තමේන්තුව ඒ සඳහා සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කරනු ලැබේ. | |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට තක්සේරු වටිනාකම රු.1,600,000 ක් වූ ධාවන තත්ත්වයේ පැවති අංක 61 – 3364 දරන වාහනය රු.870,507 ක් වැය දරා අලුත්වැඩියා කිරීමට නිර්දේශිතව තිබුණු නමුත් එය ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු කර තිබුණි. එසේ වුවද, තක්සේරු වටිනාකම රු.1,200,000 ක් වූ අංක 61 – 5126 දරන වාහනය එකතුව රු.931,938 ක් එනම් ඊට වැඩි මුදලක් වැය කරමින් අලුත්වැඩියා කර තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේදී ධාවනය කර තිබූ දුර ප්‍රමාණය කිලෝමීටර් 5835 ක් විය. මේ අනුව එම වැය දැරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව නිරීක්ෂණය කෙරේ. | අංක 61 – 3364 දරන රථයේ අපහරණය සම්බන්ධයෙන් තීරණය කර ඇත්තේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 හි 03 පරිච්ඡේදය පරිදි පත් කරන ලද කමිටුවක් විසින් වන අතර, අදාළ කමිටුව විසින් මුදල් චක්‍රලේඛ 02/2015 හි 04 අ III කාණ්ඩය යටතේ ඉහත අංක දරන වාහනය අපහරණය කිරිම නිර්දේශ කර ඇත. එම වාහනය අපහරණය කර ඇත්තේ අදාළ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව බව සඳහන් කරමි. | ආයතනය විසින් වත්කම් අපහරණය කිරීමේදී සමාන ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කාර්යාලය සඳහා අවශ්‍යතාවය සලකා බැලීමකින් තොරව ටෝනර් මිලදී ගැනීම හේතුවෙන් 2017 වර්ෂයටත් පෙර මිලදී ගෙන ඇති වර්ග 16 කට අදාළ ටෝනර් 131 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අභාවිතව පැවතුණ බව නිරීක්ෂණය විය. | 2010 වර්ෂයේ සිට මිලදී ගෙන තිබූ ටෝනර් හා කාට්‍රිජ්වලින් මෙම ඉතිරිවීම් ගබඩාවේ දැකිය හැකි වුවද, එම ඉතිරි වීම් වසර 5ක් පමණ ඉක්මවූ මුද්‍රණ යන්ත්‍රවලට අදාළව වාර්ෂිකව (වසර 11ක් තුළ) ඉතිරි වී ඇති ඒකක වේ. මෙම ටෝනර් හා කාට්‍රිජ් වෙනත් රජයේ ආයතන වෙත ලබාදීමට විමසීම් සිදු කළ ද දැනට ඊට අදාළ මුද්‍රණ යන්ත්‍ර භාවිතයේ නොමැත. 2020 වර්ෂයේදී විනාශ කිරීමට සැලසුම් කළද නොහැකිවූ බැවින් 2021 වර්ෂය තුළදී ඉවත් කිරීමට සැලසුම් කර ඇත. | අවශ්‍යතාවය පිළිබඳව සලකා බලමින් මිලදීගැනීම් සිදු කිරීමට හා ඒවා ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 **පාඩු හා හානි**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ වාහනයක් 2019 සැප්තැම්බර් 03 දින අනතුරකට ලක් වී රු.23,250 ක අලාභයක් සිදු වී තිබුණි. මු.රෙ. 104 වාර්තාවේ නිර්දේශ අනුව ඒ පිළිබඳව තොරතුරු වසන් කිරීම හා පොලිස් පැමිණිල්ලක් නොදැමීම යන හේතු මත සහකාර අධ්‍යක්ෂ හා රියදුරුගෙන් පිළිවෙලින් සියයට 02 ක් හා සියයට 05 ක් වන සේ රු.1,628 ක අලාභයක් අයකරගෙන තිබුණි. වාහනය සඳහා තෙවන පාර්ශවයේ රක්ෂණාවරණයක් පමණක් තිබීම හේතුවෙන් ආවරණය කර ගැනීමට නොහැකි ඉතිරි අලාභය වූ රු.21,622 ක් කපා හැරීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 ජනවාරි 18 දින අනුමැතිය ලබා දී තිබුණද එම කපාහැරීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | මෙම වාහන අනතුරට අදාළව මුදල් රෙගුලාසි 104(4) පරිදි පත් කළ අවසන් පරික්ෂණ වාර්තාවේ නිර්දේශයන් අනුව අදාළ අය කිරීම් සිදු කර ඇත. එම වාහන අනතුර රියදුරුගේ නොසැලකිළිමත් බවට හෝ වරදක් බවට නිෂ්චිතවම හඳුනාගත නොහැකි බව පරික්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණ හා නිර්දේශවල සඳහන් කර ඇත. එම රියදුරු සහ සහකාර අධ්‍යක්ෂ විසින් අදාළ අනතුරින් පසු ගත යුතු ක්‍රියා මාර්ග නොගැනීම නිසා පමණක් මෙම අය කිරීම් සිදු කර ඇත. කෙසේ වුවද අදාළ අනතුරෙහිදී රථය ධාවනය කිරීමේදී රියදුරු විසින් වරදක් සිදු කර ඇති බවට තහවුරු වී නොමැති අවස්ථාවක එම අලාභය රියදුරුගෙන් අය කර ගත නොහැකි බවද සඳහන් කරමි. | අනතුර පිළිබඳ තොරතුරු වසන් කිරීම හා පොලිසියට පැමිණිලි නොකිරීම සම්බන්ධව පියවර ගත යුතුය. |
| (ආ) | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 ජූලි 09 දින දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ලබාදී තිබූ කැබ් රථයකට 2018 පෙබරවාරි 10 දින මැතිවරණ රාජකාරිවල යෙදී තිබියදී රියදුරුගේ නොසැලකිල්ල මත සිදු වූ අනතුරක් හේතුවෙන් රු.3,831,172 ක අලාභයක් සිදු වී තිබුණි. ඉන් රු.3,569,318 ක් රක්ෂණාවරණයෙන් පියවාගෙන තිබූ අතර ඉතිරි රු.261,854 රියදුරුගෙන් අයකර ගැනීමට මු.රෙ. 104 (4) අවසන් වාර්තාවෙන් 2019 ඔක්තෝබර් 31 දින නිර්දේශ කර තිබුණි. එහෙත් එම මුදල් අයකර ගෙන නොතිබුණි. | 2018 මැතිවරණ රාජකාරි අතරතුරදී සිදු වූ අනතුරට අදාළ මුදල් රෙගුලාසි යටතේ වන අවසන් පරික්ෂණ වාර්තාව අංක LUPPD/1/11/1/1/ACC/PF 6063 හා 2019 දෙසැම්බර් 18 දිනැති ලිපියෙන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, එම ලිපිය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අංක LUPPD/3/5/1 හා 2020 පෙබරවාරි 12 දිනැති ලිපිය මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙතද අනුමැතිය සඳහා යොමු කර ඇත. 2021 | අදාළ අලාභය රියදුරුගෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පෙබරවාරි 11 පළමු සිහි කැඳවීම් ලිපියද යවා ඇති නමුත් අනුමැතිය ලැබී නොමැති හෙයින් අනුමැතිය ලැබෙන තෙක් මෙම අය කිරීම් සිදු කිරීමට නොහැකි වේ. | |
| (ඇ) | 2020 ජුනි 03 දින අංක WPNC–5787 දරන වාහනය අනතුරකට ලක්වී රු.45,000 ක අලාභයක් සිදු වී ඇති අතර, ඉන් රු.28,000 ක් පමණක් පාඩු හා හානි ලේඛනයේ සඳහන් කර තිබුණි. මු.රෙ. 104 (4) අවසන් පරීක්ෂණය සඳහා 2020 ජූලි 15 දින කමිටුවක් පත්කර ඇති නමුත් එම පරීක්ෂණ සිදු කර අලාභයට අදාළ පාර්ශ්වකරුවන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2020 ජුනි 03 දිනැති අනතුරට අදාළ අවසන් පරීක්ෂණ කමිටුවෙහි කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. දෙපාර්තමේන්තුවේ පවතින මාණ්ඩලික නිලධාරි හිඟය හේතුවෙන් පරීක්ෂණ මණ්ඩල කිහිපයක් සඳහා එකම නිලධාරින් පත් කර තිබීම සහ වර්තමානයේ පවතින COVID 19 තත්ත්වය නිසා නිලධාරින් සහ වගකිව යුතු පාර්ශව රැස් කර ගැනීමේ අපහසුතාවය මත මෙම පරීක්ෂණ පැවැත්වීම ප්‍රමාද වී ඇත. රටෙහි පවතින තත්ත්වය සාමාන්‍ය අතට හැරුනු පසු කඩිනමින් මෙම පරීක්ෂණ අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇත. | නොපමාව පරීක්ෂණය නිම කර අලාභයට වගකිවයුත්තන් හඳුනාගත යුතුය. |
| (ඈ) | අංක 61 – 2377 දරන වාහනය 2020 මාර්තු 05 දින අනතුරකට ලක් වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කර අලාභය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | 61 – 2377 රථයේ සිදු වූ එම අනතුරට අදාළව ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදුකරන ලෙස දන්වා ඇතත් 2020 මාර්තු මාසයෙන් පසු ඇති වූ COVID 19 තත්ත්වය හේතුවෙන් නියමිත දින 14 තුළ ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කිරීමට නොහැකි වී ඇත. ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කිරීමට නියමිත කාලය ඉක්ම ගොස් ඇති බැවින් මුදල් රෙගුලාසි 104 (4) යටතේ අලාභයන් පිළිබඳව අවසන් පරීක්ෂණ කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගෙන ඇත. | මු.රෙ.104 ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කර අලාභය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේදී රු.250,000 කට තක්සේරු කර කැබලිකර විකිණීමට නිර්දේශ කර තිබුණු අංක 61-3660 දරන ජීප් රථය සඳහා පුද්ගලික ගැනුම්කරුවකුගෙන් රු.2,238,000 ක මිලක් ඉදිරිපත් වී තිබුණු අතර, එම මිල ගණන් ලැබීමෙන් පසුව මෙය ධාවනයේ යෙදිය නොහැකි වාහනයක් සේ සලකා අපහරණ ක්‍රියාවලිය අත්හිටුවා තිබුණි. නැවත 2019 ජුලි 24 දින වටිනාකම රු.730,000 කට තක්සේරු කරන ලද එම ජීප් රථයේ ලියාපදිංචිය අවලංගු කර අබලි ද්‍රව්‍ය වශයෙන් 2020 ජනවාරි 31 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. | 2018 වර්ෂයේ ගර්හිත වාහන වෙන්දේසිය සඳහා වාහන ඉදිරිපත් කිරීමේදී අතපසුවීමකින් 61-3660 වාහනය ඉදිරිපත් කර ඇති අතර එම වාහනය රු.250,000 කට තක්සේරු කර කැබලි කර විකිණීම සඳහා මෝටර් රථ පරීක්ෂක ඇතුළු තාක්ෂණික කමිටුව නිර්දේශ කර තිබුණි. එහෙත් අතපසුවීමකින් එම තත්ත්වය වෙන්දේසියේ දී සඳහන් කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම වාහනය සඳහා ඉහල මිල ගණන් ලැබී ඇත. එහෙත් මිලදී ගන්නා ගැනුම්කරුට මාර්ගයේ එය ධාවනය කළ නොහැකි වාහනයක් බැවින් මිලදී ගැනීමෙන් වන අපහසුතා මගහැරීම සඳහා මෙය වෙන්දේසි කටයුතුවලින් ඉවත් කරන ලදි. | ආයතනයේ වත්කම් අපහරණ ක්‍රියාවලිය සඳහා නිර්දේශ කිරීමේදී එම වත්කම් පිළිබඳව අවධානය යොමු කර නිවැරදි ආකාරයට කටයුතු කළ යුතුය. |

# 4. යහපාලනය

## 4.1 මහජනයා වෙත සේවා ඉටුකිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහජනතාවට ආයතනය සම්බන්ධ නිවැරදි හා කාලීන දත්ත ලබාගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම පිළිබඳව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරී රැස්වීම්වලදී අවස්ථා කීපයකදීම සාකච්ඡා කර ඉදිරියට එය සංවර්ධනය වියයුතු ආකාරය පිළිබඳව විෂය භාර නිලධාරියා වෙත උපදෙස් හා මහ පෙන්වීම් ලබා දෙන ලදී . විශේෂයෙන් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය අදහස් යෝජනා ඉදිරිපත් කිරීමට හා ඒ තුළ යාවත්කාලීන වියයුතු තොරතුරු නියාමනය කිරීමට මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව මගින් අදාළ කටයුතු සිදුකරමින් පවතී. | තීරණ ගැනීම සඳහා මෙම තොරතුරු අදාළ කරගන්නා ආයතනවලට හා මහජනතාවට නිරවද්‍ය හා කාලීන තොරතුරු ලබා ගත හැකිවන ආකාරයට දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත් තථ්‍ය සංඛ්‍යාව 633 ක් වූ බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ 13 ක්, තෘතියික මට්ටමේ 01ක්, ද්විතීයික මට්ටමේ 34 ක් හා ප්‍රාථමික මට්ටමේ 16 ක් සමග මුළු පුරප්පාඩු 64 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදී හා ආයතනයේ අරමුණු ඉටු කරගැනීමේදී කාර්යක්ෂමව කටයුතු කිරීමට එය බාධාවක් වී තිබුණි. | එකඟ වේ.<br>මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුර සඳහා බඳවා ගැනීමට 2017 ජුනි 13 දිනැති ලිපියෙන් කළ ඉල්ලීම අනුව 2020 නොවැම්බර් 09 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී විභාග දෙපාර්තමේන්තුව සීමිත තරග විභාගය අගෝස්තු මාසයේදී පැවැත්වීමට අපේක්ෂිතය. දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය සඳහා සහ සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය රාජ්‍ය සේවා කොමිසම් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් සංවර්ධන නිලධාරින් ලෙස අන්තර්ග්‍රහණය වීම පිළිබඳ බඳවා ගැනීමේ පටිපාටිය උපදෙස් පරිදි සංශෝධනයට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. තෘතියික මට්ටමට අයත් පුරප්පාඩු පුරවන ලෙසද, ද්විතීයික මට්ටමේ තනතුරු අතරින් ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිසම් සභා චක්‍රලේඛ 1/2012 අනුව බඳවා ගැනීමට නොහැකි බැවින් එම පුරප්පාඩු සංවර්ධන නිලධාරින්ගෙන් පිරවීම සඳහාද, ද්විතීයික මට්ටමේ අනෙකුත් පුරප්පාඩු පිරවීම සඳහාද රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර | ආයතනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කිරීමට හැකිවනු පිණිස පවතින මානව සම්පත් කළමනාකරණය කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමටද කටයුතු කළ යුතුය. |

ඇත. ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය සහායක තනතුරේ පුරප්පාඩු 07 ක් පවතින නමුත් එය ඉදිරියේදී අවශ්‍ය නොවන තනතුරක් ලෙස හඳුනා ගෙන දැනට සිටින නිලධාරින් සඳහා දරන්නාට පෞද්ගලික වන සේ කටයුතු කරන අතර, ප්‍රාථමික ගණයේ අනෙකුත් තනතුරුවලට නිලධාරින් බඳවා ගැනීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 අනුව අත්හිටුවා ඇත.